**unit 12**

# ප්‍රංශ ආණ්ඩුක්‍රමය

වාගීෂ්වර

- ප්‍රංශ ආණ්ඩුක්‍රමය හැඳින්වීම.
- ව්‍යවස්ථාදායකය
- විධායකය
- අධිකරණය
- පක්ෂ ක්‍රමය

sureka wageeshwara

# ප්‍රංශ ආණ්ඩුක්‍රමය හැඳින්වීම

## ප්‍රංශ ආණ්ඩුක්‍රමය හැඳින්වීම. (ලක්ෂණ)

ප්‍රංශය නූතන ලෝකය තුළ දක්නට ඇති වැදගත් රාජ්‍යයකි. ප්‍රංශ ඉතිහාසය දෙස හැරී බැලීමේ දී 1789 ප්‍රංශ විප්ලවය ඓතිහාසික වැදගත් සංදිස්ථානයක් ලෙස හඳුනාගත හැකිය. ප්‍රංශ විප්ලවයට පූර්ව අවධිය තුළ ප්‍රංශය පාලනය කළේ ප්‍රජාපීඩක අත්තනෝමතික රාජ පෙලපතක් වන ලුවී රාජ පරම්පාරව විසිනි. ඒ තුළ ජනතාවගේ නිදහස, අයිතිවාසිකම්, බරපතල ලෙස උල්ලංඝණය වී තිබුණි. එහි ප්‍රතිඵලය වූයේ නැපෝලියන් බොනපාට්ගේ නායකත්වයෙන් ප්‍රංශ විප්ලවය සිදුවීමයි.

- ප්‍රංශය තුළ උත්පාද වූ ආණ්ඩුක්‍රමය ව්‍යවස්ථා කිහිපයකි.

| | | | |
|---|---|---|---|
| 01. | 1809 | - | පළමු සමූහාණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. |
| 02. | 1848 | - | දෙවන සමූහාණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. |
| 03. | 1871 | - | තෙවන සමූහාණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. |
| 04. | 1948 | - | සිව්වන සමූහාණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. |
| 05. | 1958 | - | පස්වන සමූහාණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. |

වර්තමානය තුළ ක්‍රියාත්මක වන්නේ V වන සමූහාණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. **පස්වන සමූහාණ්ඩුක්‍රම ව්‍යවස්ථාව චාල්ස් ඩී ගෝල් සෙනෙවියා සඳහාම නිර්මාණය වූවක් බව** ඩොරති පික්ලස් ප්‍රකාශ කරයි.

මෙම සමූහාණ්ඩුක්‍රම කෙටුම්පත නිර්මාණය කරන ලද්දේ **ගෝල්** සෙනෙවියාගේ බලධාරීත්වය මත **මයිකල් ඩෙබ්රේ** ගේ නායකත්වය යටතේ කුඩා ඇමති කමිටුවක් විසිනි. 1958 සැප්තැම්බර් 28 දින ජනමත විචාරනයකට භාජනය කර එය 80% වැඩි ඡන්ද ප්‍රමාණයකින් සම්මත කෙරිණ. **1958 ඔක්තෝම්බ 04 දින සිට එය ක්‍රියාත්මක වේ.**

1. **ලිඛිත ආණ්ඩුක්‍රමයක් වීම.**
   **(N.B ලිඛිත ආණ්ඩුක්‍රමයක් යනු කුමක්දැයි හඳුන්වන්න.)**

   ප්‍රංශය තුළ ක්‍රියාත්මක වන්නේ ලිඛිත ආණ්ඩුක්‍රමයකි. ආරම්භක අවස්ථාවේ දී වගන්ති 92 ක් අන්තර්ගත විය. මෙය දෙබිඩි (දෙමුහුන් ව්‍යවස්ථාවක්) ලෙස හඳුනාගත හැකිය.

2. **ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වීම.**
   **(N.B ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්දැයි හඳුන්වන්න.)**

   ප්‍රංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් එක් මධ්‍යම ආණ්ඩුවක් වෙතට පමණක් බලතල පවරා තිබේ. ඒ අනුව එය ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකි. පරිපාලනයක් පහසුව සඳහා පලාත් පාලන ආයතන ස්ථාපනය කොට තිබේ. **කැන්ටන - කොමියුන දෙපාර්තමේන්තු** නිදසුන් ලෙස දැක්විය හැකිය.

3. **අනම්‍ය ආණ්ඩුක්‍රමයක් වීම.**
   **(N.B අනම්‍ය ආණ්ඩුක්‍රමයක් යනු කුමක්දැයි හඳුන්වන්න.)**

   ප්‍රංශ ආණ්ඩුක්‍රමය අනම්‍ය ආණ්ඩුක්‍රමයකි. එය සංශෝධනය කළ හැකි ක්‍රම දෙකක් තිබේ.

**I**. **ක්‍රමය**

ව්‍යවස්ථාදායකයේ වෙන වෙනම 2/3 ක විශේෂ බහුතර අනුමැතිය හා ජනමත විචාරනයකදී ජනතාවගේ අනුමැතිය.

**II**. **ක්‍රමය**

ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තු මණ්ඩල දෙකේ (ජාතික මණ්ඩලය සෙනෙට් සභාව) ඒකාබද්ධ සැසිවාරයක දී 3/5 ක අනුමැතිය.

4. **ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් වීම.**

ප්‍රංශ ආණ්ඩුක්‍රමය නිර්මාණය කර ඇත්තේ ජනප්‍රියම දේශපාලන න්‍යාය වන ලිබරල් න්‍යාය මත පදනම් වෙමිනි. ඒ අනුව **ජනතා පරමාධිපත්‍යය, නිදහස් රහස් තරඟකාරී මැතිවරණ , මූලික අයිතිවාසිකම් , සර්වජන ඡන්දබලය දේශපාලන පක්ෂ , ජනමාධ්‍යය නිදහස** ආදී ප්‍රජාතන්ත්‍රික ලක්ෂණ බහුලව පවතී.

5. **ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකය.**

ප්‍රංශ ව්‍යවස්ථාදායකය පාර්ලිමේන්තුව ද්වි මාණ්ඩලික ආකෘතියට ස්ථාපනය කොට තිබේ. පළමු සභාව ජාතික සාව (National Assembly) වන අතර දෙවන සභාව සෙනෙට් (Senet) සභාවයි.

6. **දෙමුහුන් විධායකයක් පැවතීම.**

ප්‍රංශය දෙමුහුන් විධායකයක් සහිත රාජ්‍යයකි. ජනාධිපති හා අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය විධායක කටයුතු සිදු කරයි. මෙය මිශ්‍ර විධායක් ලෙස ද හඳුන්වයි.

7. **ව්‍යවස්ථාදායකය හා විධායකය අතර සම්බන්ධ දුරස්ථ කිරීම.**

ප්‍රංශය තුළ ව්‍යවස්ථාදායකය හා විධායකය අතර සම්බන්ධය දුරස්ථකර තිබේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විධායකයට (කැබිනට් මණ්ඩලයට) ඇතුලත් වූ පසු පාර්ලිමේන්තු සාමාජිකත්වයෙන් ඉවත් විය යුතු ය. බලතල විභේදනය ඉන් බලාපොරොත්තු වූ අරමුණ විය.

8. **බහුපක්ෂ ක්‍රමය.**

1958 ව්‍යවස්ථාවේ වැදගත් ලක්ෂණයක් වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් දේශපාලන පක්ෂ ක්‍රමයට අවකාශය සලසා තිබීමයි. ඒ අනුව ප්‍රංශය තුළ බහුපක්ෂ ක්‍රමයක් පවතී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 04 වගන්තිය ඊට අදාළ තත්ත්වයන් දක්වා තිබේ.

9. **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය.**

1958 ප්‍රංශ පස්වන සමූහාණ්ඩු ව්‍යවස්ථාව මගින් ආණ්ඩුක්‍රම සම්පාදන මණ්ඩලයක් පිහිටුවා රජයේ දෙපාර්තමේන්තු වල හා පාර්ලිමේන්තු පනත් වල ව්‍යවස්ථානුකූල භාවය පරීක්ෂා කිරීමට එම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට බලය පවරා තිබේ.

10. **ජනතා පරමාධිපත්‍යය.**

ජනතා පරමාධිපත්‍යය ප්‍රංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සතු මූලික ලක්‍ෂණයකි. සමූහාණ්ඩුවේ උපදේශ වාක්‍ය වන්නේ, **'නිදහස සමානාත්මතාවය හා සහෝදරත්වයයි.** ජාතික පරමාධිපත්‍යය මහජනයා සතුවේ. **ජනතා නියෝජිතයින්** මගින් හා **ජනමත විචාරණයක්** මගින් පරමාධිපත්‍යය ක්‍රියාත්මක කරනු ලබයි.

11. **අක්‍රමවත් අපැහැදිලි අනේකාර්ථවාචී ව්‍යවස්ථාව.**

1958 ප්‍රංශ පස්වන සමූහාණ්ඩු ව්‍යවස්ථාව අක්‍රමවත් ස්වභාවයක් ද ඇතැම් තැන් අපැහැදිලි භාවයකින් ද යුක්ත වේ. තවත් තැන් අනේකාර්ථවාචී ස්වභාවයක් ගනී. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආණ්ඩුක්‍රමය සම්පූර්ණ ලෙස විස්තර නොවේ. බොහෝ වැදගත් විධිවිදාන පනවා ඇත්තේ ආඥා පනත් මාලාවක් මගිනි.

නිදර්ශන - 1958 ඔක්තෝම්බර් හා 1959 පෙබරවාරි අතර මාස නීතිමය තුළ ආඥා පනත් 300 කට ආසන්න සංඛ්‍යාවක් පනවා තිබීම.

12. **පාර්ලිමේන්තු සහ ජනාධිපති ක්‍රමවල පවත්නා සම්මිශ්‍රණයකි.**

# ව්‍යවස්ථාදායකය

## ව්‍යවස්ථාදායකය - පාර්ලිමේන්තුව.

පොදු හැඳින්වීම

ප්‍රංශ ව්‍යවස්ථාදායක ආයතනය **පාර්ලිමේන්තුවයි.** ප්‍රංශ පාර්ලිමේන්තු ද්වි මාණ්ඩලික ආකෘතියට ස්ථාපනය කරතිබේ.

I. ජාතික මණ්ඩලය.
II. සෙනෙට් සභාව.

හැඳින්වීම

### ■ ජාතික මණ්ඩලය.

මොකක් ද?

ප්‍රංශ ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවේ පළමු සභාව ජාතික මණ්ඩලය යි. පළමු සභාව ජාතික මණ්ඩලය මහජන මන්ත්‍රී මණ්ඩලය. නියොජිත මණ්ඩලය. පහළ මන්ත්‍රී මණ්ඩලය ලෙසද හඳුන්වන්නේ ය.

සංයුතිය

සාමාජිකයන් පත්කිරීම

ජාතික මණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාව 577 කි. මෙම නියෝජිතයින් ප්‍රාදේශීය පදනමක් මත බෙදා වෙන් කරන ලද **ඒක මන්ත්‍රී ඡන්ද කොට්ඨාස පදනම් කරගනිමින් ද්වි - ඡන්ද ක්‍රමය අනුවය.** (එනම් පළමුවර ඒකාන්තර බහුතර ක්‍රමය අනුව ද දෙවනුව සරල බහුතර ක්‍රමය අනුව ) ජනතාවගේ ඍජු ඡන්දයෙන් නියෝජිතයින් තෝරාගනී. මේ අනුව **පත්වන නියෝජිතයා එම මැතිවරණ කොට්ඨාසයේ 50% ක් (ඒකාන්තර බහුතරයක්) ඡන්ද ලබාගත යුතු ය.**

නිල කාලය

ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවේ පළමු සභාව ජාතික මණ්ඩලයේ **නිලකාලය වසර 5 කි.** නමුත් නිලකාලයට පෙර එය විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට හැකිය.නමුත් ජනාධිපතිවරයාට ඒ සම්බන්ධයෙන් සීමා පවතී. ඒවා නම් **හදිසි නීතිය ප්‍රකාශයට පත් කළ විට ජනාධිපතිවරයාට විරුද්ධව දෝශාභියෝග චෝදනාවක් ආරම්භ වී ඇති විට.**

වෙනත්

ජාතික මණ්ඩලයේ සභාපතිවරයෙක් වන්නේ ය. ඔහු ප්‍රථම සැසි වාරය තුළ දී තෝරා ගනී. ඒ සඳහා තෝරාගනු ලබන්නේ ජාතික මණ්ඩලය තුළ සිටින පැරණිතම මන්ත්‍රීවරයා ය. සභාපතිවරයා සභාවේ වැඩකටයුතු හා විනය පවත්වාගෙන යයි.

### ● කාර්ය හා බලතල

(i) ව්‍යවස්ථාදායක අංශයේ කාර්ය හා බලතල.

ව්‍යවස්ථාදානය.

- ජාතික මණ්ඩලය ව්‍යවස්ථාදායක සභාවක් ලෙස නීති සම්පාදනය කරයි. මුදල් හා සාමාන්‍ය නීති යන නීති වර්ග දෙකම සම්පාදනය කළ හැකිය. මුදල් නීතියක් ආරම්භ කළ හැක්කේ ජාතික මණ්ඩලයට පමණි.

- සාමාන්‍ය නීති ආරම්භ කිරීමට බලතල තිබේ. දෙවන සභාව වන **සෙනෙට් සභාව** සම්මත කොට පළමු සභාව ජාතික මණ්ඩලයේ අනුමැතිය සඳහා එවන ලද සාමාන්‍ය පනතක් සම්මත කිරීමට, සංශෝධනය කිරීමට කල්දැමීමට, ප්‍රතික්ෂේප කිරීමට ජාතික මණ්ඩලයට හැකිය.

(ii) **විධායක අංශයේ කාර්ය හා බලතල.**

**විධායක පාලනය.**

- ප්‍රංශය මිශ්‍ර විධායකයක් පවතින රාජ්‍යයකි. ජනාධිපති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයක් විධායක කටයුතු මෙහෙයවීමයි. ජනාධිපති විධායකයේ ප්‍රධානියා වේ. ඔහු ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී නැත. නමුත් අගමැති හා අමාත්‍ය මණ්ඩලය (කැබිනට් මණ්ඩලය) ව්‍යවස්ථාදායකයේ පළමු සභාව ජාතික මණ්ඩලයට වගකීමට බැඳී සිටී. ව්‍යවස්ථාදායකයේ බහුතරකය විශ්වාසය බිඳී ගිය විට විශ්වාස භංගයෝජනාවකින් කැබිනට් මණ්ඩලය ඉවත් කිරීමට ජාතික මණ්ඩලයට හැකිය. ඒ අනුව විධායකය පාලනයට ජාතික මණ්ඩලයට හැකිය.

- ජනාධිපතිවරයා ඉවත් කිරීමට අදාළ දෝශාභියෝග චෝදනාව මුලපිරීමට බලය ඇත්තේ පළමු සභාව වන ජාතික මණ්ඩලයට පමණි.

(iii) **දින 12 ට වඩා යුද නීතිය දීර්ග කිරීමට අනුමැතිය දීම.**

(iv) **ගිවිසුම් , සම්මුතීන් සඳහා අනුමැතිය දීම.**

(v) **මූල්‍යමය බලතල.**

(vi) **කොමිෂන් සභා පිහිටුවීම.**

(vii) **මහජනතාවගේ දුක්ගැනවිලි අවශ්‍යතාවයන් සොයා බැලීම.**

(viii) **මන්ත්‍රීවරු පුහුණු කිරීම (අනාගත නායකයින් පුහුණු කිරීම)**

## ■ සෙනෙට් සභාව.

හැඳින්වීම.

මොකක් ද?

ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවේ දෙවන සභාව සෙනෙට් සභාවයි. මෙම මණ්ඩලය උත්තර මන්ත්‍රී මණ්ඩලය, ඉහළ මණ්ඩලය ලෙස ද හඳුන්වයි.

සංයුතිය (සාමාජිකයින් පත් කිරීම)

සෙනෙට් සභාවේ සාමාජිකයින් 321 කි. මොවුන් තේරී පත්වන්නේ ජනතාවගේ **ඍජු ඡන්දයෙන් නොවේ. මෙම සාමාජිකයින් ආකාර දෙකකට තෝරා ගනී.**

321

300
(විශේෂිත ඡන්ද විද්‍යාලයකින් තෝරා ගනී)

| | |
|---|---|
| ඡන්ද විද්‍යාලයට අදාළ කාණ්ඩායම් | ජාතික මණ්ඩලයේ නියෝජිතයින්<br>+<br>අමාත්‍යය මණ්ඩලය<br>+<br>පළාත් පාලන ආයතන |

21
(ප්‍රංශය සතු විදේශීය භූමිභාග තුළ ජීවත් වන ප්‍රංශ ජාතිකයන්ගෙන් තෝරාගනී.)

නිලකාලය — <u>සෙනෙට් මණ්ඩලය එකවර විසිර නොයන ස්ථාවර සභාවකි.</u> සභාවෙන් 1/3 එකක් වසර 3කට වරක් ඉවත්වෙයි. ඒ අනුව **එක් සාමාජිකයෙක් වසර 9 ක ධූරකාලයක් දරයි.**

වෙනත් — සෙනෙට් සභාව මෙහෙය වන්නේ සභාපතිවරයා විසිනි. ඔහු වසර 03 ක ධූරකාලයක් දරයි.

- <u>කාර්ය හා බලතල.</u>

## (i) <u>ව්‍යවස්ථාදායක අංශයේ කාර්ය හා බලතල.</u>

ව්‍යවස්ථාදානය

ව්‍යවස්ථාදායක සභාවක් ලෙස නීති සම්පාදනය කරයි. **මුදල් හා සාමාන්‍යය නීති** සම්බන්ධයෙන් බලතල තිබේ. **මුදල් පනත් ආරම්භ කිරීමට නොහැකිය.** පළමු සභාව <u>ජාතික මණ්ඩලය සම්මත කොට සෙනෙට් සභාවේ අනුමැතිය සඳහා එවන ලද මුදල් පනතක් සම්මත කිරීමට , සංශෝධනය කිරීමට, කල් දැමීමට , ප්‍රතික්ෂේප කිරීමට බලතල ඇත</u>.

<u>**සාමාන්‍ය පනත්** කෙටුම්පත් සෙනෙට් සභාවට ආරම්භ කළ හැකිය</u>. එසේම පළමු සභාව ජාතික මණ්ඩලය සම්මත කොට <u>සෙනෙට් මණ්ඩලයේ අනුමැතිය සඳහා එවන ලද සාමාන්‍යය පනතක් සම්මත කිරීමට, සංශෝධනය කිරීමට, කල් දැමීමට , ප්‍රතික්ෂේප කිරීමට</u> බලතල ඇත.

**(N.B)** <u>**සෙනෙට් මණ්ඩලයට ජාතික මණ්ඩලයට වඩා බලවත් භාවයෙන් අඩු වන්නේ කරුණු කිහිපයක් නිසා පමණි.**</u>

I. මුදල් පනත් කෙටුම්පත් සෙනෙට් සභාව තුළ ආරම්භ කිරීමට නොහැකි වීම.

II. ආණ්ඩුවට එරෙහිව ගෙන එන විශ්වාස භංග යෝජනාව ආරම්භ කිරීමට (මුල පිරීමට) නොහැකි වීම.

III. අමාත්‍ය මණ්ඩලය සෙනෙට් සභාවට වගකීමට බැඳී නොමැති වීම.

IV. ජනාධිපතිවරයාට එරෙහි දෝශාභියෝග චෝදනාව ආරම්භ කිරීමට (මුලපිරීමට) සෙනෙට් මණ්ඩලයට නොහැකි වීම.

ඉහත සඳහන් බලතල හා කාර්යයන් හැර අනෙකුත් බලතල හා කාර්යයන් සම්බන්ධයෙන් ජාතික මණ්ඩලය හා සෙනෙට් සභාව සමාන බලතල භුක්ති විඳී.

- <u>පනත් කෙටුම්පත් නීති බවට පත්වන ආකාරය.</u>

පාර්ලිමේන්තුවේ මණ්ඩල දෙකෙන්ම සම්මත වූ පනත් කෙටුම්පත ජනාධිපතිවරයාගේ අවසාන අනුමැතියෙන් නීතියක් බවට පත් වේ. <u>ජනාධිපතිවරයාට හෝ සම්බන්ධයෙන් නිශේධ බලය භාවිතා කළ හැකිය</u>.

<u>ප්‍රංශ පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය.</u>

ප්‍රංශ පාර්ලිමේන්තුව ස්වාධිපත්‍යය පරමාධිකාරී බලය සහිත පාර්ලිමේන්තුවක් නොවේ. ප්‍රංශයේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටක් ද යක්න සැකසිතෙන තරමට පාර්ලිමේන්තුවේ බලය සීමාව වී තිබේ.

- <u>පාර්ලිමේන්තු පරමාධිපත්‍යය (ස්වාධිපත්‍ය)</u>

  'ස්වාධිපති පාර්ලිමේන්තුවක් යනුවෙන් අදහස් කරනු ලබන්නේ වෙනත් ආයතනවල බලපෑමකින් හෝ සීමාවකින් තොරව නීති සම්පාදනයට හැකියාව ඇති පාර්ලිමේන්තුවක් ය'

  'ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවේ අභිමතයට අනුව ඕනෑම නීතියක් සම්පාදනයට - සංශෝධනයට - නිශේධනය කිරීමට පාර්ලිමේන්තුව සතු පරම සහ අසීමිත අධිකාරී බලය පාර්ලිමේන්තු පරමාධිපත්‍යය යන්නෙන් සංකේත වේ.'

- <u>ස්වාධිපති නොමැති පාර්ලිමේන්තුවක හඳුනාගත හැකි ලක්ෂණ කිහිපයකි</u>.

★ නීති සම්පදානය සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකයට සමාන හෝ උසස් ආයතනයන් පැවතීම.
★ ව්‍යවස්ථාදායකයේ නීති සම්පාදන බලය සීමාකරන වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ දැක්වීම.
★ ව්‍යවස්ථාදායකයේ නීති සම්පාදන බලයට බලපෑම් කිරීමට හැකි වීම.

<u>ප්‍රංශ පාර්ලිමේන්තුව ස්වාධිපත්‍යය පාර්ලිමේන්තුවක් නොවන බවට ඉදිරිපත් කළ හැකි නිදර්ශන.</u>

(i) පාර්ලිමේන්තුවට නීති පැනවිය හැක්කේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වූ සීමිත කරුණු සම්බන්ධයෙන් පමණි. අනිකුත් ආඥා ජනාධිපතිවරයා පනවයි.

(ii) 38 වන වගන්තියට අනුව ව්‍යවස්ථාදායකය සතු බලතල විධායකයට පවරන මෙන් ඉල්ලා සිටිය හැකිය.

(iii) ව්‍යවස්ථාදායක පනත් නිශේධ කිරීමට ජනාධිපතිවරයාට හැකිවීම.

(iv) පාර්ලිමේන්තුව කැඳවීම, කල් දැමීම, විසුරුවා හැරීම පාර්ලිමේන්තුවෙන් පරිබාහිර ජනාධිපතිවරයාට පවරා දීම.

(v) ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව මඟ හැර ජනමත විචාරණ කරා යෑමේ අවකාශය.

(vi) ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව මඟ හැර නීතියක බලය සහිත ආඥා නිකුත් කිරීමට හැකි වීම.

(vii) ජනාධිපති තෝරා ගැනීම සඳහා ව්‍යවස්ථාදායකය සම්බන්ධ නොවීම.

(viii) ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය නිසා.

(ix) ප්‍රංශය තුළ බහු පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වීම. ඒ තුළ ජාතික මණ්ඩලය තුළ කිසිදු පක්ෂයක් අධි බහුතරයක් නොලැබීම.

# විධායකය

## වි ධායකය

ප්‍රංශයේ ඇත්තේ **මිශ්‍ර විධායකයකි. දෙමුහුන් ක්‍රමයකි.** ප්‍රංශය චිරාත් කාලයක් දේශපාලන අස්ථාවර භාවයෙන් පීඩා විඳි රාජ්‍යයකි. එම නිසා ජනාධිපති හැර අගමැති ප්‍රමුඛ කැබිනට්ටුවක් හඳුන්වා දී ඇත්තේ ආණ්ඩුවේ කොටසක් අප්‍රාණික වුවහොත් අනෙක් කොටස සප්‍රාණික වේය යන අදහසිනි. ප්‍රංශය අරාජික වීම වැලැක්වීම එහි අරමුණ විය.

ව්‍යවස්ථානුකූලව ගත් විට ප්‍රංශයේ බලවත්ම ධූරය ජනාධිපතිවරයාය. ප්‍රායෝගිකව පැත්තකින් බලන විට ජනාධිපති බලවත් වන අවස්ථා මෙන්ම අගමැති බලවත් වන අවස්ථා පැවතිය හැකිය. ජනාධිපති බලවත් වන්නේ ස්වකීය පක්ෂය පාර්ලිමේන්තුව තුළ බහුතර බලය දිනාගෙන ඇති විටය. අගමැති බලවත් වන්නේ ජනාධිපතිවරයාගේ පක්ෂයට ව්‍යවස්ථාදායකය තුළ බහුතර බලය නොමැති අවස්ථාවන්හිදීය. **එනම් සහ හැසිරීමක් පවතින විටය.** ඒ අනුව ප්‍රංශ විධායකය කොටස් කිහිපයකි.

1. ජනාධිපතිවරයා
2. කැබිනට් මණ්ඩලය
3. අගමැතිවරයා.

## ■ ජනාධිපතිවරයා.

හැඳින්වීම.

කවුද?

ප්‍රංශ ජනාධිපතිවරයා **රාජ්‍ය නායකයා - විධායකයේ ප්‍රධානියා - ආණ්ඩුවේ නායකයා - සන්නද්ධ සේවාවන්හි සේනාධි නායකයා** වන්නේ ය.

● ජනාධිපතිවරයා සම්බන්ධයෙන් පලවී ඇති අදහස්.

> "අපගේ පාලන තන්ත්‍රයේ මුදුන් ගල වන්නේ ආණ්ඩුවේ ජනාධිපති වරයෙකු පිළිබඳ නව සංස්ථාවයි. එය ප්‍රංශ ජනතාවගේ විචාර බුද්ධියෙන් හා හැඟීම් වලින් ප්‍රංශයේ රාජ්‍යය නායකයා හා මාර්ගෝපදේශකයා වශයෙන් නම් කරනු ලැබිණ."
>
> -චාල්ස් ඩී ගෝල් සෙනවි-

සුදුසුකම්

ප්‍රංශ ජනාධිපතිවරයෙකුට තරඟ කරන අපේක්ෂකයෙකු විසින් සම්පූර්ණ කළ යුතු <u>සුදුසුකම්</u> සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම.

(i) ප්‍රංශ පුරවැසියෙකු විය යුතුය.
(ii) වයස අවුරුදු 35 ඉක්මවිය යුතු ය.
(iii) දෙවරක් ජනාධිපති ධූරය නොදැරූ අයෙකු විය යුතු ය.
(iv) දෝශාභියෝග චෝදනාවකින් ඉවත් කළඅයෙක් නොවිය යුතු ය.
(v) නියමිත මිලිටරීය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.
(vi) ත්‍රිවිධ හමුදාවේ අධිකාරිය ලත් නිලයක් වසර 10 ක් වත් දරා තිබිය යුතු ය.

නිලකාලය | ජනාධිපතිවරයාගේ නිලකාලය මැතක් වන තුරුම වසර 7 ක් විය. එය දීර්ඝ නිල කාලයක් බැවින් ජනාධිපතිවරයා ඒකාධිපතියෙකු ලෙස ක්‍රියා කිරීමට ඇති හැකියාව නිසා 2006 ජනමත විචාරණයක් මගින් ජනාධිපතිගේ නිල කාලය වසර 5 ක් දක්වා අඩු කළේ ය. **නිල කාලය ඉක්ම යාමට පූර්වයේ දෝශාභියෝග චෝදනාවක් මගින් ජනාධිපති වරයා ඉවත් කළ හැකිය.**හැකිය.

**ජනාධිපතිවරයා තෝරා ගන්නා ක්‍රියා පිළිවෙත.**

## 1962 පෙර අවධිය තුළ,

පස්වන (V) ප්‍රංශ සමූහාණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරම්භවන අවස්ථාවේ දී ජනාධිපතිවරයා තෝරා ගත්තේ ඡන්ද විද්‍යාලයක් (වරණ මණ්ඩලයක්) මගිනි.

| | | |
|---|---|---|
| ඡන්ද විද්‍යාලය | = | පාර්ලිමේන්තුවේ උභය මන්ත්‍රී මණ්ඩල වල මන්ත්‍රීවරුන් + ප්‍රංශය සතු විදේශීය භූමිභාග වලින් තෝරාගත් නියෝජිතයන් + ප්‍රංශයේ පලාත් පාලන ආයන වල මන්ත්‍රීන් |

ජනාධිපතිවරයෙකු ලෙස තේරී පත් වීම සඳහා ඡන්ද විද්‍යාලයේ ඒකාන්තර බහුතරයක් (50%) ඡන්ද ලබා ගත යුතු ය.

## 1962 පසු අවධිය තුළ,

**1962 ඔක්තෝම්බර් 28 දා ඩී ගෝල් සෙනෙවි** ජනමත විචාරණයක් මගින් ජනාධිපතිවරයා සෘජු ජනතා ඡන්දයෙන් තේරීපත්වීමට අදාළ පනත් කෙටුම්පත සම්මත කොට ගනිමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළේ ය. **ඒ අනුව ජනාධිපති වරයා ජනතාවගේ සෘජු ඡන්දෙයන් තේරී පත් වන්නේ ය. ජනාධිපතිවරයා තෝරා ගැනීම සඳහා නියත බහුතර (ඒකාන්තර බහුතර) ඡන්ද ක්‍රමය භාවිතා කරනු ලබයි.**

ජනාධිපතිවරයා තෝරා ගනු ලබන්නේ ඒකාන්තර බහුතර (නිත්‍ය බහුතර) නියෝජන ක්‍රමය පදනම් කර ගිනිමිනි. එනම් ජනාධිපතිවරයා ලෙස තේරී පත්වීමට මහජනතාවගේ ඡන්දයෙන් 50% (ඒකාන්ත බහුතරයක්) ලබාගත යුතු ය. ජනාධිපතිවරණය සඳහා ජනාධිපති අපේක්ෂකයන් දෙදෙනෙක් පමණක් ඉදිරිපත් වී ඇති විටක ඒකාන්තර බහුතරය (50%) ලබා ගැනීම පහසු වේ. නමුත් ජනාධිපති අපේක්ෂකයන් කිහිප දෙනෙක් ඉදිරිපත් වී ඇති විට ඒකාන්තර බහුතරයක් (50%) ලබා ගැනීම අපහසු වේ. ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ කිසිදු අපේක්ෂකයෙකුටවත් ඒකන්තර බහුතරයක් ඡන්ද ලබා ගැනීමට නොහැකි වුවහොත් **වැඩිම ඡන්ද ලැබූ ජනාධිපති අපේක්ෂකයින් දෙදෙනා ඉතිරිකර අනෙක් අය තරගයෙන් ඉවත් කරයි. එම වැඩිම ඡන්ද ලැබූ අපේක්ෂකයින් දෙදෙනා වෙනුවෙන් නැවත මැතිවරණයක් පවත්වයි.** එම මැතිවරණය ප්‍රථම මැතිවරණය පැවැත් වූ දිනට පසුව එන ඉරිදා නොව ඊළඟ ඉරිදා එනම් (සති දෙකකදී) පවත්වනු ලබයි. එහි දී අපේක්ෂකයින් දෙදෙනෙක් පමණක් ඇති නිසා නියත ලෙසම එක් අපේක්ෂකයෙකුට ඒකාන්තර බහුතරයක් (50%) ක් ඡන්ද ලබාගැනීමට හැකිය.

උදා -: 2011 ජනාධිපතිවරණය.

| අපේක්ෂකයාගේ නම | 1 වටය | 2 වටය |
|---|---|---|
| නිකලොස් සර්කෝෂි | 31.18% | 53.06% |
| සිගොනල් රෝයල් | 25.87% | 46.94% |
| ෆැන්කොයිස් බයිරෝවු | 18.57% | |

ජනතා ඍජු ඡන්දයෙන් (50%) ක් ලබා ගත් ජනාධිපති අපේක්ෂකයා අගවිනිසුරු ඉදිරියේ දිවුරුම් දීමෙන් අනතුරුව ජනාධිපති ධූරයේ වැඩ භාර ගනී.

## ජනාධිපති ඉවත් කරන ආකාරය.

ප්‍රංශ ජනාධිපතිවරයා ඉවත් කරන්නේ දෝෂාභියෝගයක් මගිනි. ජනාධිපතිට විරුද්ධව **රාජ්‍යද්‍රෝහීවීම - ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම - චරිත දූෂණය - ස්ථිර කායික මානසික විකෘතිය** යන චෝදනා මත දෝශාභියෝගයක් ආරම්භ කිරීමට ව්‍යවස්ථාදායකයේ පළමු සභාව ජාතික මණ්ඩලයට හැකිය. ජාතික මණ්ඩලය තුල 2/3 ක් සම්මත කළ යෝජනාවට දෙවන මණ්ඩලය වන සෙනෙට් මණ්ඩලය 2/3 කින් එකඟ විය යුතුය. ඉන් අනුරූ මහාධිකරණය නම් විශේෂ අධිකරණ ආයතනය මගින් එම දෝෂාභියෝග චෝදනා පත්‍රය විභාග කරයි.

ජනාධිපති ධූරයේ පුරප්පාඩු ඇති වූ විට නව ජනාධිපතිවරයා තෝරා ගන්නා තෙක් සෙනෙට් සභාවේ සභාපතිවරයා ජනාධිපතිධූරයේ වැඩ බලයි. නව ජනාධිපතිවරයා තෝරාගත යුත්තේ ජනාධිපති ධූරයේ පුරප්පාඩු වී **දින 20 කට නොඅඩු** හා **දින 35 කට නොවැඩි** කාලසීමාවක් තුළ දී ය.

## ජනාධිපතිවරයාගේ කාර්ය හා බලතල.

ප්‍රංශ තුළ දෙමුහුන් විධායකයක් පවතී. ජනාධිපති හා කැබිනට් මණ්ඩලය විධායක කටයුතු සිදු කරයි. ජනාධිපතිවරයා කැබිනට් මණ්ඩලයේ නායකයා වේ. රාජ්‍ය නායකයා විධායකයේ ප්‍රධානියා - සන්නද්ධ සේවාවන්හි සේනාධි නායකයා වන්නේ ද ජනාධිපතිවරයා ය. ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායකය, විධායක , අධිකරණ , යන ත්‍රිවිධ අංශ සතුව විශාල බලතල ප්‍රමාණයක් භුක්ති විඳී.

- ව්‍යවස්ථාදායක අංශයේ කාර්ය හා බලතල.

(i) **පනත් කෙටුම්පත් වලට අවසාන අනුමැතිය ලබා දීම.**

ප්‍රංශ ව්‍යවස්ථාදායකය පාර්ලිමේන්තුවයි. පාර්ලිමේන්තුවේ මණ්ඩලය දෙක සම්මත කරන පනත් කෙටුම්පත් නීති බවට පත් වීමට විධායක ජනාධිපති වරයාගේ අවසාන අනුමැතිය අවශ්‍ය වේ. පාර්ලිමේන්තුව සම්මත කොට ජනාධිපතිවරයාගේ අවසාන අනුමැතිය සඳහා ඉදිරිපත් කළ පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් ජනාධිපතිට ගත හැකි පියවර කිහිපයකි,

- පනත් කෙටුම්පතට අනුමැතිය දී එය නීතියක් බවට පත් කිරීම.
- අනුමත නොකොට එම කෙටුම්පත නැවත සලකා බලන ලෙස පාර්ලිමේන්තුවට හරවා යැවීම.
- පනත් කෙටුම්පතට අනුමැතිය නොදී දින 15 ක් රඳවා තබා ගෙන එම පනත නිශේධ කිරීම.

(ii) **පාර්ලිමේන්තුව (ජාතික මණ්ඩලය) කැඳවීම , කල්දැමීම හා විසුරුවා හැරීම.**

ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවේ පළමු සභාව ජාතික මණ්ඩලය විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට හැකිය. නමුත් ඒ සඳහා පාර්ලිමේන්තුවේ මණ්ඩල දෙකේ සභාපතිවරුන්ගෙන් හා අගමැතිවරයාගෙන් ඒ සම්බන්ධයෙන් විමසිය යුතු ය. නමුත් එම උපදෙස් පිළිගැනීමට ජනාධිපතිවරයා බැඳී නොමැත. නමුත් ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සම්බන්ධයෙන් සීමා පවතී.

- **පාර්ලිමේන්තුව රැස්වී වසරක් ඉක්ම යාමට පෙර පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට නොහැකිය.**
- **හදිසි අවස්ථාව ක්‍රියාත්මක වන විට පාර්ලිමේන්තුය විසුරුවා හැරමීට නොහැකිය.**
- **ජනාධිපතිට විරුද්ධව දෝශාභියෝග චෝදනාවක් ආරම්භ වී ඇති විට පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට නොහැකිය.**

(iii) **ජනමත විචාරණ කැඳවීම.**

ආණ්ඩුව ඉල්ලූ විට හෝ පාර්ලිමේන්තුවේ මණ්ඩල දෙක ඉල්ලූ විට ජනමත විචාරණයක් කැඳවීමට ජනාධිපතිවරයාට හැකිය. අවශ්‍ය නම් එම ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමට ද හැකිය. ස්වකීය අභිමත පරිදි ජනමත විචාරණයක් කැඳවීමට ද ජනාධිපතිවරයාට හැකිය.

**නිදර්ශන -: සුප්‍රකට මාස්ට්‍රිච්ට් ගිවිසුම ජනමත විචාරණයට ලක් කිරීම.**

(iv) **පාර්ලිමේන්තුව ඇමතීම හා පණිවුඩ යැවීම.**

(v) **පාර්ලිමේන්තුවේ අමතර සභාවාර කැඳවීම.**

(vi) **පාර්ලිමේන්තුව සකස් කරන නීති වල ව්‍යවස්ථානුකූල භාවය පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයෙන් විමසීමේ බලය.**

(vii) **හදිසි තත්වයක දී විසුරුවන ලද පාර්ලිමේන්තුව යලි කැඳවීම.**

(viii) **විශේෂ අවස්ථාවල පාර්ලිමේන්තුවේ මුලසුන දැරීම.**

(ix) **නීතිමෙන් වලංගු වන ආඥා නිකුත් කිරීමේ බලය.**

- <u>විධායක අංශයේ කාර්ය හා බලතල.</u>

(i) **අගමැති පත් කිරීම.**

ප්‍රංශ අගමැතිවරයා පත් කරනු ලබන්නේ විධායකයේ ප්‍රධානියා අගමැති විසිනි. අගමැති පත් කිරීම සම්බන්ධයෙන් පැහැදිලි විධි විදාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා නොමැත. නමුත් අගමැතිවරයෙකු ලෙස තේරීපත්වීමට පහත සුදුසුකම් සම්පූර්ණ කර තිබීම වැදගත් වේ.

- ජනාධිපතිවරයාගේ පෞද්ගලික පිළිගැනීමට ලක් වූ අයෙක් වීම.
- ව්‍යවස්ථාදායක ජාතික මණ්ඩලය තුළ ඔහුට ඇති සහයෝගය.

**(N.B)** **ප්‍රායෝගික භාවිතය තුළ සිදුවන්නේ ව්‍යවස්ථාදායකයේ වැඩිම දෙනාගේ විශ්වාසය දිනාගත් පුද්ගලයා අගමැතිධුරයට තේරී පත් වීමයි.**

(ii) **අමාත්‍ය මණ්ඩලය පත් කිරීම.**

පාර්ලිමේන්තුව තුලින් අමාත්‍යය මණ්ඩලය තෝරාපත් කරයි. මෙහි දී ජනාධිපතිවරයා අගමැතිගේ උපදෙස් ලබා ගනී.

(iii) **අමාත්‍යය මණ්ඩලයේ මුලසුන දැරීම.**

අමාත්‍යය මණ්ඩලය අගමැතිගේ මූලිකත්වයෙන් රැස්වී සාකච්ඡා කොට තීරණ වලට එළඹිය ද ඒවා අවසාන වශයෙන් අනුමත වීමට ජනාධිපතිවරයාගේ මූලිකත්වයෙන් අමාත්‍යය මණ්ඩලය රැස්විය යුතු ය.

(iv) **හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කිරීම.**

පාර්ලිමේන්තුවේ මණ්ඩල දෙකේ සභාපතිවරුන් දෙදෙනාගෙන් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් මේ පිළිබඳ විමසිය යුතු ය.

(v) **අමාත්‍යය මණ්ඩලය සකස් කරන අණ පනත්වලට අවසාන අනුමැතිය ලබා දීම.**

(vi) **අමාත්‍යය මණ්ඩලය සංශෝධනය කිරීම.**

(vii) **සන්නද්ධ සේවාවන්ට අණදෙන නිලධාරියා වීම.**

(viii) **රාජ්‍ය සේවකයින් පත් කිරීම හා ඔවුන් පාලනය කිරීම.**

(ix) **රාජ්‍ය මුද්‍රාව පරිහරණය කිරීම.**

(x) **ප්‍රංශ ජනරජය නියෝජනය කිරීම.**

(xi) **සන්නද්ධ සේවාවන්හි ප්‍රධානීන් පත් කිරීම.**

(xii) **විදේශීය ගිවිසුම්වලට එළඹීම.**

(xiii) **තානාපතිවරු පත් කිරීම හා පත් කර එවන ලද තානාපතිවරු පිළිගැනීම.**

- <u>අධිකරණ අංශයේ කාර්ය හා බලතල.</u>

(i) අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ භාරකරු ලෙස කටයුතු කිරීම.

(ii) උත්තරීතර අධිකරණ කවුන්සිලයේ (උසස් අධිකරණ මණ්ඩලය) සාමාජිකයින් පත් කිරීම.

(iii) වරදකරුවන්ට සමාව දීම.

- <u>චාරිත්‍රානුකූල බලතල.</u>

(i) ජනාධිපතිවරයා නඩු පැවරීමෙන් නිදහස් වීම.

(ii) ජාතිය ඇමතීම.

(iii) නම්බුනාම ප්‍රධානය කිරීම.

(iv) රාජ්‍යය උත්සව වල මුලසුන දැරීම.

□ <u>ප්‍රංශ ජනාධිපතිවරයා තවදුරටත් බලවත් වීමට බලපෑ හේතු.</u>

1. සෘජු මහජන ඡන්දෙයන් තේරී පත් වීම.

2. ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවට වගකීමට බැඳී නොමැති වීම.

   ජනාධිපතිවරයා මහජනතාවට වගකිව යුතු ය. නමුත් ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවට වගකීමට බැඳී නොමැත. පාර්ලිමේන්තුවට ජනාධිපතිවරයා විශ්වාස භංග යෝජනාවකින් ඉවත් කළ නොහැකි ය.

3. ජනාධිපතිවරයා ඉවත් කරන දෝශාභියෝගය දැඩි අනම්‍යය ස්වභාවයක් ගැනීම.

4. නූතන ජනාධිපතිවරු ජනාධිපති ලේකම් කාර්යාලය මගින් තවදුරටත් බලවත් වීම.

   රාජ්‍යය ප්‍රතිපත්ති තීරණය කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පවරා තිබෙන්නේ අගමැති ප්‍රමුඛ අමාත්‍යය මණ්ඩලයට වේ. නමුත් <u>වර්ථමානය තුළ රාජ්‍යය ප්‍රතිපත්ති ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිර්මාණය කරයි. ඒ අනුව ද ජනාධිපතිවරයා බලවත් වී තිබේ</u>.

5. චාල්ස් ඩී ගෝල් ගේ පෞරුෂය.

6. ජනාධිපතිට පාර්ලිමේන්තුව මඟ හැර ආඥා පැනවීමට හැකි වීම.

7. ජනමත විචාරන මගින් නීති සම්පාදනය කර ගැනීමට ජනාධිපතිට හැකි වීම.

## ▪ කැබිනට් මණ්ඩලය.

මිශ්‍ර ආණ්ඩුක්‍රමයක් පවතින ප්‍රංශය තුළ විධායකයන් දෙකක් පවතී. එය දෙමුහුන් විධායකයක් ලෙස හඳුන්වයි. ජනාධිපති වරයා එක් විධායකයක් වේ. අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය එක් විධායකයකි. ඒ අනුව කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක කැබිනට් මණ්ඩලයක් තරම් ප්‍රංශ කැබිනට් මණ්ඩලය බලවත් නැත.

කැබිනට් මණ්ඩලයට සාමාජිකයින් පත්කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි. ජනාධිපතිවරයාගේ පෞද්ගලික පිළිගැනීමට ලක් වූ පාර්ලිමේන්තුවේ සහයෝගය ඇති. ප්‍රායෝගික තලය තුළ පාර්ලිමේන්තුවේ වැඩිම දෙනාගේ විශ්වාසය දිනාගත් මන්ත්‍රීවරයා අගමැති ලෙස ජනාධිපතිවරයා විසින් පත් කරයි. පසුව කැබිනට් අමාත්‍යවරු ව්‍යවස්ථාදායකය තුළින් තෝරාපත් කරයි. **ව්‍යවස්ථාදායකයට පරිබාහිර පුද්ගලයන් ද කැබිනට් මණ්ඩලයට ඇතුළත් කර ගනී.** කැබිනට් මණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාව නිශ්චිත දක්වා නොමැත.

**කොන්දේසි -:**

- **පාර්ලිමේන්තුවෙන් කැබිනට් මණ්ඩලයට තෝරාගත් මන්ත්‍රීවරුන් ඡන්ද කොට්ඨාස වලින් හා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීධූර වලින් ඉවත්විය යුතු ය.**
- **කැබිනට් ඇමතිවරුන්ට පාර්ලිමේන්තුවට යැමට, සංවාද වලට සම්බන්ධ වීමට හැකිය. නමුත් ඡන්දය ප්‍රකාශ කළ නොහැකිය.**
- **පාර්ලිමේන්තුවට පරිබාහිර පුද්ගලයන් ද කැබින්ට් මණ්ඩලයට බඳවාගත හැකිය.**

- ප්‍රංශ අමාත්‍යය මණ්ඩලය රැස් වන ක්‍රම 02 කි.

- ඇමතිවරු අගමැතිගේ මූලිකත්වයෙන් රැස් වූ විට එය හඳුන්වනු ලබන්නේ කැබිනට් මණ්ඩලය ලෙසිනි.
- **ජනාධිපතිගේ මූලිකත්වයෙන්** ඇමතිවරු රැස් වූ විට එය හඳුන්වනු ලබන්නේ අමාත්‍යය මණ්ඩලය යනුවෙනි.

කැබිනට් මණ්ඩලවේ නිලකාලය වසර 05 කි. නමුත් නිලකාලය පෙර කැබිනට් මණ්ඩලය ඉවත් කළ හැකිය. ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවට විධායක කැබිනට් මණ්ඩලය සාමූහිකව වගකීමට බැඳී සිටී. එසේ වග නොකියන විට විශ්වාස භාංගයෝජනාවක් මගින් කැබිනට් මණ්ඩලය ඉවත් කළ හැකිය. නමුත් ජනාධිපතිවරයා ඉවත් කළ නොහැකිය.

- කැබිනට් මණ්ඩලය කාර්ය හා බලතල (භූමිකාව).

1. **ආණ්ඩුවේ ප්‍රතිපත්ති තීරණය කිරීම.**
2. **නීති ක්‍රියාත්මක කිරීම.**
3. **පරිපාලන කටයුතු විධිමත් කිරීම.**

## ■ අගමැතිවරයා.

මිශ්‍ර ආණ්ඩුක්‍රමයක් ප්‍රංශය තුළ ක්‍රියාත්මක වේ. එම නිසා ප්‍රංශ අගමැතිවරයා කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක දරණ සුවිශේෂී ස්ථානයට පත් නොවේ. විධායකයේ ප්‍රධානියා ජනාධිපතිවරයා ය. එම නිසා **අගමැතිවරයා දරණු ලබන්නේ අතරමැදි තත්ත්වයකි.**

8 වන වගන්තියට අනුව අගමැතිවරයා පත් කරනු ලබන්නේ ජනාධිපතිරයා විසිනි. එම පත් කිරීම් සම්බන්ධ විධිමත් විධිවිධාන පස්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ සටහන් කර නැත. ජනාධිපතිවරයා අගමැති තෝරා පත් කරන විට පහත කරුණු සම්බන්ධයෙන් විමසිලිමත් වේ.

I. **ජනාධිපතිවරයාගේ පෞද්ගලික පිළිගැනීමට ලක් වූවක් වීම.**
II. **පාර්ලිමේන්තුවේ ජාතික මණ්ඩලය තුළ ඔහුට ඇති සහයෝගය.**

**(N.B) ප්‍රායෝගික තත්වය තුළ සිදුවන්නේ පාර්ලිමේන්තුවේ බහුතරයකගේ විශ්වාසය දිනාගත් මන්ත්‍රීවරයා අගමැති ලෙස පත් කිරීයි.**

**නිදර්ශන -:** 2001 දී දක්ෂිනාංශික ජනාධිපති ජැක් සිරාක් අගමැතිධූරය පිරිනැමුවේ සමාජවාදී පක්ෂයේ ලයනල් ජොක්සින්ටය.

ප්‍රංශ අගමැතිවරයාගේ **නිල කාලය වසර 05කි.** ඊට පෙර අගමැති ධූරය හිස් වන්නේ ඉල්ලා අස්වීම, මිය යෑම , ආණ්ඩුව කෙරෙහි විශ්වාස භංගයෝජනාවක් සම්මත වීම, ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ව්‍යවස්ථාදායකය තුළ සම්මත නොවීම, වැනි හේතු මතය.

ප්‍රංශ අගමැතිවරයා පත් කරනු ලබන්නේ ජනාධිපතිවරයා වුවද, අගමැතිවරයා ඉවත් කිරීමට ජනාධිපතිවරයාට නොහැකිය. අගමැතිවරයා ඉවත් කළ හැක්කේ ව්‍යවස්ථාදායකය තුළ සම්මත කළ විශ්වාස භංග යෝජනාවකින් පමණි.

### ● අගමැතිවරයාගේ කාර්ය හා බලතල.

1. **ඇතැම්විට ආණ්ඩුව මෙහෙයවන නායකයා වීම.**

ප්‍රතිවිරුද්ධ පක්ෂවල ජනාධිපතිවරු හා අගමැතිවරු ඇතිවිට (සහහැසිරීමක් පවතින විට) ආණ්ඩුව මෙහෙය වන නායකයා අගමැතිවරයා බවට පත්විය හැකිය.

**නිදර්ශන -:** 1986 දී සමාජවාදී ජනාධිපති මිතෝරොන් හා ඩිගෝල් පක්ෂයේ අගමැති ජැක් ශිරාක්.

2. **අමාත්‍ය මණ්ඩලය තෝරා ගැනීම.**

ව්‍යවස්ථාදායකය තුළින් අමාත්‍යවරුන් කැබිනට් මණ්ඩලයට පත් කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි. ඒ සඳහා අගමැතිගේ උපදෙස් මත එය සිදු කරයි.

3. **ප්‍රතිපත්ති පිළිබඳ තීරණ ගැනීම.**

අගමැතිගේ මූලිකත්වයෙන් කැබිනට් මණ්ඩලය රැස්වී රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කරයි. එම ප්‍රතිපත්ති ස්ථිර වන්නේ ජනාධිපතිගේ මූලිකත්වයෙන් අමාත්‍යය මණ්ඩලය රැස්වී ජනාධිපති එම ප්‍රතිපත්ති වලට අනුමැතිය ලබාදුන් පසු ය.

4. **කැබිනට් මණ්ඩලයේ මුලසුන ගැනීම.**

අගමැතිගේ මූලිකත්වයෙන් අගමැතිවරු රැස් වූ විට එය හඳුනවනු ලබන්නේ කැබිනට් මණ්ඩලය යනුවෙනි.

5. **අගමැති සතු බලතල අමාත්‍යවරුන්ට පැවරීමට හැකි වීම.**

6. **අවශ්‍යතා පැන නැගුණ හොත් සභාවල හා කමිටුවල සභාපති වශයෙන් ජනාධිපති වෙනුවට කටයුතු කළ යුත්තේ ය.**

7. **කිසියම් විශේෂිත පදනමක් මත නිශ්චිත පැවරුමකින් හා විශේෂ කාර්ය පත්‍රයක් මත ඇමති මණ්ඩලයේ රැස්වීමක සභාපති ලෙස ජනාධිපතිවරයා වෙනුවට කටයුතු කළ හැකිය.**

# අධිකරණය

# අධිකරණය

අධිකරණය යනු රාජ්‍යයක නීති විනිශ්චය කරන ආයතනය යි. වෙනත් රාජ්‍යයක අධිකරණයට සාපේක්ෂව ප්‍රංශ අධිකරණ පද්ධතිය වෙනස් වේ. **ප්‍රංශය තුළ ක්‍රියාත්මක වන්නේ ප්‍රංශයට ආවේණික අධිකරණ රටාවකි.**

> **"අධිකරණය රජයේ ව්‍යවස්ථාදායක හා විධායකය යන අංශවලින් පැහැදිලිව වෙනස් වන අංශයක් වශයෙන් සැලකීම ප්‍රංශ ජාතිකයන්ගේ පුරුද්දක් නොවේ."**
>
> -මුන්රෝ-

ප්‍රංශ අධිකරණ සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගැනීම සඳහ අධිකරණ ක්‍රමය තුළ පවතින ලක්ෂණ හඳුනා ගැනීම වැදගත් වේ.

(i) **ද්විත්ව ධූරාවලිය.**

ප්‍රංශය තුළ අධිකරණ ධූරාවලි දෙකක් තිබේ. **සිවිල් හා අපරාධ නඩු සම්බන්ධ වූ** පොදු නීති සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට **සාමාන්‍යය උසාවි** ඇත්තේ ය. සාමාන්‍යය උසාවි වල අග්‍රස්ථානය වන්නේ **නිවාරණ උසාවිය** යි. පරිපාලන බලධාරීන්ගේ ක්‍රියාවන්ට හා එකී බලධාරීන්ට එරෙහිව පුරවැසියන් ඉදිරිපත් කරන දුක්ගැනවිලි සඳහා **පරිපාලන උසාවි** ද පවතී. පරිපාලන උසාවිවල අග්‍රස්ථානයේ ඇත්තේ ද **රාජ්‍යය සභාවයි.**

(ii) **අධිකරණ සමාලෝචනයෙන් තොර බව.**

පාර්ලිමේන්තු මගින් සම්මත කර ඇති නීති ව්‍යවස්ථානුකූල නොවේ යැයි ප්‍රකාශ කිරීමේ බලය ප්‍රංශයේ උසාවි සතු නොවේ. **එනම් අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය ප්‍රංශ අධිකරණය සතු නොවේ. නමුත් පූර්ව නිරීක්ෂණ බලය තිබේ.** පාර්ලිමේන්තුව සම්මත කළ පනතක් නීතියක් බවට පත් වීමට පෙර එම පනත් ප්‍රකාශයට පත් කිරීමට පෙර එම පනතේ ව්‍යවස්ථානුකූල භාවය පරීක්ෂාවට **ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට** හැකිය. ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට එසේ කළ හැක්කේ **ජනාධිපති, අගමැති , ජාතික සභාවේ සභාපති , සෙනෙට් සභාවේ සභාපති** ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් කළ විට පමණි.

(iii) **පිළිගැටුම් උසාවි.**

සාමාන්‍යය උසාවි හා පරිපාලන උසාවි ලෙස ප්‍රංශය තුළ උසාවි වර්ග දෙකක් පවතී. ඒ අනුව සාමාන්‍යය උසාවි වල අග්‍රස්ථානය නිවාරණ උසාවියටත් පරිපාලන අධිකරණ වල අග්‍රස්ථානය රාජ්‍ය සභාවටත් හිමි වේ. **මෙම උසාවි වල අවසාන අධිකරණ බලයෙන් පැන නගින ආවුල් විසඳීම සඳහා කිසියම් විශේෂිත උසාවියක් අවශ්‍ය විය.** එම අවශ්‍යතාවය අරභයා 1872 දී **පිළිගැටුම් උසාවියක්** පිහිටුවිය.

(iv) **පර්කේ සංස්ථාව.**

පර්කේ යන්නෙන් හැඳින්වෙන මෙම සංස්ථාව ප්‍රංශ අධිකරණ පද්ධතියහි සුවිශේෂී ලක්ෂණයක් වන්නේ ය. **කියුරේටරයෙකු** හෙවත් රජයේ නීතීඥයකුගේ සභාපතීත්වයෙන් ද ඔහුට සහය වීම සඳහා තවත් කිහිපදෙනෙකුගෙන් ද මෙම පර්කේ සංස්ථාව සමන්විත ය. **රජයේ පැමිණිල්ලේ නීතීඥයෙකු විසින් ඉටු කරනු ලබන කාර්යය මෙම පර්කේ සංස්ථාව විසින් ඉටු කරයි.**

(v) **අධිකරණයේ ස්වාධීනත්වය.**

ප්‍රංශයේ අධිකරණයේ ස්වාධීන්තවය ආරක්ෂා කිරීමේ වගකීම ජනාධිපති වෙත පැවරී ඇත්තේ ය. උසස් අධිකරණවලට විනිශ්චකරුවන් පත් කරනු ලබන්නේ උසස් විනිශ්චකාර මණ්ඩලය (උත්තරීතර අධිකරණ කවුන්සිලය) විසින් ඉදිරිපත් කළ යෝජනාවකට අනුවය. උසස් අධිකරණ ආයතන වල නිලධාරීන් පත් කිරීම, මාරු කිරීම , විනය පාලනය සම්බන්ධයෙන් පිහිටුවා ඇති ආයතනය උත්තරීතර අධිකරණ කවුන්සිලය වේ. මෙහි සාමාජිකයන් 9 කි. ජනාධිපතිවරයා සභාපති වන්නේ ය. උපසභාපති වන්නේ අධිකරණ අමාත්‍යවරයා ය.

(vi) **හබයාස්කෝපුස් ආඥාව.**

හබයාස්කෝපුස් ආඥාව යනු ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට පැමිණවීමේ ආඥාවයි. ඒ අනුව පස්වන සමූහාණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් කිසිවකු හිතුමතේ අත්තඩංගුවට ගත නොහැකි බවත් රඳවා තබා ගැනීමට නොහැකි බවත් පුද්ගල නිදහස ආරක්ෂා කිරීමේ මුරදේවතාව අධිකරණය බවත් ප්‍රකාශයට පත් කරන ලදි.

(vii) **විධායක හා ව්‍යවස්ථාදායක කටයුතු සම්බන්ධයෙන් අධිකරණයට සීමිත බලයක් පවරා දීම.**

ප්‍රංශ ආණ්ඩුක්‍රමය තුළ අධිකරණය ද්විතියික ස්ථානයට පත්කර තිබේ. අධිකරණයට විධායකය පාලනය කළ නොහැකි ය. විධායක ජනාධිපති යනු අධිකරණය ආරක්ෂා කරන්නා ය. ඒ අනුව ජනාධිපති පාලනය කිරීමට අධිකරණයට නොහැකි ය. ප්‍රංශයේ ජනාධිපතිට විරුද්ධව ගෙන එන දෝශාභියෝග පරීක්ෂා කර බලන්නේ මහඅධිකරණය නම් වූ විශේෂ අධිකරණයක් මගිනි.

ප්‍රංශ අධිකරණ ධූරාවලී දෙකක් යටතේ සංවිධාන ගත කර තිබේ. **සාමාන්‍යය උසාවි හා පරිපාලන උසාවි** ලෙස දැක්විය හැකිය.

## සාමාන්‍යය උසාවි.

සාමාන්‍යය උසාවි

| සිවිල් උසාවි | අපරාධ උසාවි |
|---|---|
| සාමවිනිසුරු | පොලිස් උසාවි |
| ප්‍රාථමික උසාවි | අභියාචනා උසාවි |
| අභායාචනා උසාවි | ඇසයිස් උසාවි |
| කැෂේසන් උසාවි | දණ්ඩාධිකරණය |

- **සාමවිනිසුරු**

සාමාන්‍යය උසාවිවල පහළම තලයේ ඇත්තේ සාමවිනිසුරුවන්ය. ඔවුන් පත් කරනු ලබන්නේ අධිකරණ අමාත්‍යවරයාගේ යෝජනාවක් පරිදි ජනාධිපතිවරයා විසිනි. සුළු වැරදි හා සිවිල් ආරවුල් පිළිබඳව සීමිත හා ලඝු අධිකරණ බලයක් ඔවුන් සතු ය.

- **අභියාචනා උසාවි**

ප්‍රාථමික අධිකරණ තීන්දු සම්බන්ධයෙන් වන අභියාචනා මෙහිදී සලකා බලයි. සිවිල් හා අපරාධ නඩු සම්බන්ධ අභියාචනා විභාග කරනු ලබයි.මෙම උසාවි පිහිටුවනු ලබන්නේ තෝරාගත් ප්‍රදේශවලය.

## පරිපාලන උසාවි

පරිපාලන උසාවි පිහිටුවා ඇත්තේ ප්‍රංශයේ දීර්ගකාලයක් සිට පැවත එන්නා වූ පරිපාලන නීතිය. පරිපාලනය කිරීම සඳහාය. මෙම පරිපාලන නීති හා පරිපාලන උසාවි ඒ .වී ඩයිසිගේ නීතියේ ආධිපත්‍යය සංකල්පයට පටහැනි වූවකි.

පරිපාලන නීති පද්ධතිය තුළ පහත සඳහන් ලක්ෂණ හඳුනාගත හැකිය , රාජ්‍ය නිලධාරීන් සාමාන්‍ය උසාවිවල අධිකරණ බලතල වලින් නිදහස් වීම - රාජ්‍ය නිලධාරීන්ගේ වැරදි ක්‍රියාවන් සඳහා පුද්ගලයන් පෞද්ගලිකව නඩු පවරන විට ඒවා විනිශ්චය කිරීම සඳහා විශේෂ විනිශ්චය සභාවක් පිහිටු වීම - රාජකාරී කටයුතු පෞද්ගලික කටයුතු වලින් වෙනස් කොට දැක්වීම - අත්තනෝමතික රාජ්‍යය බලධාරීන් අනිත් පුද්ගලයන්ට සිදු වූ යම් අනතුරු වලට ඔවුන් වන්දි ගෙවනු ලැබේ. පීඩනයට පත් වූවන් ට සහන සැලසීමේ ක්‍රම සැපයීම.

පරිපාලන උසාවි

ප්‍රාදේශීය සභා | රාජ්‍යය සභාව

- **ප්‍රාදේශීය සභා**

  පරිපාලන උසාවි වල පහළම තලයේ උසාවිය ප්‍රාදේශීය සභා වන්නේ ය. එවැනි උසාවි 22 ක් පමණ තිබේ.

- **රාජ්‍ය සභාව**

  පරිපාලන උසාවිවල ඉහළම උසාවිය වන්නේ මෙයයි. එහි සාමාජිකයින් 150 කි. එම සාමාජිකයින් පත් කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි.

**තවදුරටත්,**

**උත්තරීතර අධිකරණ කවුන්සිලය.**
**(උසස් විනිශ්චකාර මණ්ඩලය)**

ප්‍රංශයේ අධිකරණ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් ඉහළම ආයතන ලෙස උත්තරීතර අධිකරණ කවුන්සිලය දක්වා තිබේ. මෙම ආයතනය උසස් අධිකරණ නිලධාරීන් පත් කිරීම , මාරු කිරීම , විනය පානය සම්බන්ධයෙන් පිහිටුවා තිබේ. මෙහි සාමාජික සංඛ්‍යාව 09 කි. සභාපතිවරයා ජනාධිපති ය. උප සභාපති අධිකරණ ආමාත්‍යවරයා ය. අනෙක් සියලු සාමාජිකයින් ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය
(ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විශේෂිත ආයතනයකි. ප්‍රංශය තුළ අධිකරණ ප්‍රති නිරීක්ෂණ බලය ක්‍රියාත්මක නොවේ. එම බලය ක්‍රියාවට නගනු ලබන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසිනි. ජනාධිපතිවරයා හෝ අගමැතිවරයා, ජාතික මණ්ඩලයේ සභාපතිවරයා, සෙනෙට් මණ්ඩලයේ සභාපතිවරයා විසින් පාර්ලිමේන්තුව සකස් කරන පනත් කෙටුම්පතක ව්‍යවස්ථානුකුල භාවය පරීක්ෂා කරන ලෙස දැන්වුව හොත් ව්‍යවස්ථාසම්පාදක මණ්ඩලයට පනත් කෙටුම්පත්වල ව්‍යවස්ථානුකුල භාවය පරීක්ෂා කළ හැකි ය.

මෙහි සාමාජිකයින් සංඛ්‍යාව 09 කි. මෙම නව දෙනාට අමතරව සභාපතිත්වය ජනාධිපතිවරයා දරණු ලබන අතර උප සභාපතීත්වය අධිකරණ අමාත්‍යවරයා දරයි. සාමාජිකයින් 9 දෙනාගෙන් 3 ක් ජනාධිපතිවරයා විසින් ද , 3 ක් ජාතික මණ්ඩලයේ සභාපතිවරයා විසින් ද 3 ක් සෙනෙට් මණ්ඩලයේ සභාපතිවරයා විසින් ද පත් කරයි. වසර 3 කට වරක් සංඛ්‍යාවෙන් 1/3 ඉවත් වන අතර එක් සාමාජිකයෙකු වසර 9 ක ධූරකාලයක් මෙහි සිටී.

## මහාධිකරණය.

ප්‍රංශයේ අධිකරණ කටයුතු වලදී මහ අධිකරණ යනුවෙන් විශේෂ අධිකරණ ආයතනයක් පිහිටුවා තිබේ. මන්ත්‍රී මණ්ඩලයේ හා සෙනෙට් සභාවේ එක් එක් මහා මැතිවරණයකින් පසු අදාළ තරාතිරම්වලට අයත් මණ්ඩල දෙකේම සාම මන්ත්‍රීන් සංඛ්‍යාවකින් මහාධිකරණය සකස් වේ. එහි සභාපතිවරයා තෝරාගනු ලබන්නේ ඔවුන් අතරින්මය. රාජ්‍යය ද්‍රෝහීත්වය සම්බන්ධයෙන් ජනාධපතිවරයාට එරෙහිව ගෙන එන දෝශාභියෝග චෝදනාව විභාග කිරීම, මන්ත්‍රීවරුන්ට නඩු පැවරීම මෙහි බලතල වේ.